# ඉංජිනේරු සිතුවිල්ලෙන් ගොඩනැගුණු අයිපල් කුළුණ



ලෝකයේ ඇති අරුම පුදුම නිර්මාණයන් අතුරින් ප්‍රංශයේ මනස්කාන්ත ඊපල් කුළුණ ශ්‍රේෂ්ඨ ස්ථානයක වැජඹෙයි. ඇමරිකන් ඉංජිනේරුවන් දෙදෙනෙකුගේ අනුපමේය සිතිවිල්ලක් වූ මෙය එහිදී කඩදාසියකට පමණක් සීමා විය. පසුව ඉන්ජිනේරුවකු වූ සැබිලෝ විසින් ප්‍රංශයට ගෙන එන ලදුව එවකට සිටි දක්ෂ ඉංජිනේරුවකු වූ ගස්ටාප් ඊපල්ගේ ද සහයෝගය ඇතිව ඇමරිකන් සිතිවිල්ල ක්‍රියාත්මක විය.

ශ්‍රේෂ්ඨ නිර්මාණයක් වූ මෙය ප්‍රංශයේ ශ්‍රී විභූතිය උද්වහනය කරන සංකේතය බවට පත් වූවා පමණක් නොව වර්ෂයක් පාසා කෝටි ගණනින් මුදල් සපයන ප්‍රධාන ධනෝපායන මාර්ගයක් ද විය.

ගස්ටාප් ඊපල් තමා මුහුණ පා සිටි ආර්ථික පීඩනයන් මාධ්‍යයේ පවුම් දස ලක්ෂයක මුදලක් මේ සඳහා වෙන් කළ අතර මෙම කුළුණ ගොඩ නැගීමට වැයවේ යයි ඇස්තමේන්තු කරන ලද ඉතිරි මුදල් ප්‍රමාණය වූ පවුම් පත් ලක්ෂය රජයෙන් ලබා ගත්තේ ය.

සේන් නදිය ඉක්මනින් අඩි 984 කුත් අගල් 10 ක් උසට ගොඩනගන ලද මේ සුවිසල් කුළුණේ වැඩ වර්ෂ 1887 දී ආරම්භ කරන ලදී. ආරම්භයේ දී මෙන් නොව කුළුණේ වැඩ කෙරීගෙන යන් ම නොයෙකුත් බාධකයන් විරුද්ධවාදීකම් මතුවන්නට පටන් ගත්තේ ය. මෙම කුළුණ පැරීසියේ නිවෙස් පියෙසිවලට වඩා ඉහළට ඉස්මතුවන්නට පටන් ගත් විට නගර වැසියෝ කෝප වූහ. ඇලෙක්සැන්ඩර් ඩූමා, ගී ද මෝප සාං ආදී ලොව පතල ලේඛකයන් ඇතුළු සිය ගණනක් විසින් අත්සන් තබන ලද පෙත්සමක් ද ඉදිරිපත් කරන ලදී. අද ලොව ඇති උසම ගොඩනැගිලිවලින් තුන්වැන්න වූ මෙය අඩි 700 ක් පමණ උඩදී පුපුරා විනාශ වී ඇදහැලෙනු ඇතැයි අනාවැකි පළ කළ ඉංජිනේරුවෝ ද වූහ. කුළුණ ගොඩගන්නා උන්මන්තකයකු යයි කවුරුත් සිතාසුණ හ. මුළු මහත් ප්‍රංශයේ ම මොහුටත් මේ ගොඩනගන කුළුණටත් එක සේ ද්වේශ කළහ.

මේ සම්බන්ධයෙන් ගස්ටාප් ඊපල්ට තිබුණ එකම සහයෝගය නම් නගර සභාව විසින් ඔහුට දෙන ලද බලපත්‍රයත් ඉන් ලැබුණු අනුබලයත් පමණී. කොතෙකුත් එල්ලවුණ මහජන විරෝධතාවන් ගණනකටවත් නොගත් හේ කුළුණ බැඳීමේ වැඩ ලහි ලහියේ කරගෙන ගියේය. වර්ෂ 1889 අවසාන වීමට පෙර කුළුණේ වැඩ අවසන් විය.

විවේකාගාර, අවන්හල්,භෝජනාගාර ආදියෙන් සමන්විත මෙම දැවැන්ත කුළුණෙහි 300 ක පමණ සේවක සංඛ්‍යාවක් වැඩෙහි යෙදී සිටිති. ගුවන් විදුලි කථා සහ රූපවාහිනී ප්‍රචාරක ස්ථානයන් ද ආකාස වස්තු පරීක්ෂණාගාරයක් ද කාලගුණ පරීක්ෂණාගාරයක් ද ඇතුළු තවත් නොයෙකුත් ෂඩ්‍යාගාරයන් සඳහා උඩ මහල් තලය වෙන්ව ඇත.

මෙම සුවිසල් කුළුණෙහි සිව් වෙන් මහලේ සිට පළමුවෙනි ගුවන් විදුලි පණිවුඩය නිකුත් කරන ලද්දේ 1898 වර්ෂයේ දීය. "එඩෙඩ් බෙලින්" නැමැත්තකු විසින් වර්ෂ 1925 දී පළමුවන රූපවාහිනී සේයාරූව ප්‍රචාරය කර හරින ලදී.

ත්‍රාසජනක සිද්ධීන් කීපයක් ද මෙම ඊපල් කුළුණ නිසා ඇති විය. වර්ෂ 1912 දී තමා විසින් සාදගත්තා ලද පියාපත් දෙකක් දෙපස බැඳගෙන කුළුණ මුදුනේ සිට බිමට පැන්න ඇඳුම් මහත්තෙක් අභාග්‍යසම්පන්න ලෙස මරුමුවට පත් විය. වර්ෂ 1928 දී මාර්සලගේ කැමැත්තෙන් තමා විසින් සාද ගත්තා ලද පැරෂූටයක් අත්හද බැලීමට ගොස් බිමට පැන ජීවිතක්ෂයට පත් විය. තවත් වරක් "පියර් ලැබ්‍රික්" නම් අයෙක් කුළුණු හිණි මගේ ඇති පඩි 347 ම පා පැදියකින් බැසීමෙන් කරන ලද ඒ වීර ක්‍රියාව සැමරීමේ උත්සවය අවුරුදු පතා පවත්වනු ලැබේ. කුළුණ නරඹන ව්‍යාජයෙන් ගොස් සිය දිවි නසා ගත්තාවුන් පාලක පක්ෂයට ලොකුම හිසරදයක් විය. පසුව එවැනි දිවිනසා ගැනීම් වැලැක්වීම සඳහා වෙනම ම පාලක පිරිසක් එක් කිරීමට සිදු විය. වරක් සුප්‍රසිද්ධ නිළියක් දිවිනසා ගැනීමට දෙවරක් උත්සහා කොටත් එයට ඉඩ නොලැබුනෙත් ඇය සේන් නදියේ පිහිට පැතුවා ය.

අයෝමය කුළුණ සඳහා වූ සම්පූර්ණ වියදම පළමු වර්ෂ දෙක ඇතුළතදීම ලැබිණ. දහස් ගණන් සංචාරකයෝ කුළුණ නරඹමින් එහි විවේක ගැනීම සඳහා පැමිණෙන්නට වූහ. වරක් හැමදෙනා විසින්ම ද්වේශ කරන ලද මේ කුළුණ හැම දෙනම ආදරයෙන් සහ ගෞරවයෙන් සිහිපත් කරන්නට වූහ. මේ ගැන කවියෝ කවි කීහ. ලේඛකයෝ කථා ලිවූහ. සිත්තරු එය ලක්ෂණ සිත්තමට නැගූහ. චිත්‍රපට නිෂ්පාදකයෝ එය චිත්‍රපටයට ගත්හ. 1952 වර්ෂයේ දී මෙය නැරඹූ සංචාරකයින් ගණන දෙලොස් ලක්ෂය ද ඉක්ම වූහ. නරඹන්නන් සංඛ්‍යාව වර්ෂයෙන් වර්ෂයට සීඝ්‍රයෙන් ඉහළ නගී. දැනට තුන් කෝටියකට වඩා ජනතාවක් මෙය නරඹා ඇත.

මෙම සුවිසල් කුළුණේ වර්ෂ 7 කට වරක් තීන්ත ගානු ලැබේ. අවශ්‍ය තීන්ත ප්‍රමාණය ටොන් 35 කි. නයිලෝන් බුරුසු 1200 ක් මේ සඳහා උපයෝගී කර ගනී.

ලොව ශ්‍රේෂ්ඨ නිර්මාණයක් වූ මෙය පුපුරවා හැරීම සඳහා කබාය ඇතුළත පුපුරන ද්‍රව්‍ය සඟවාගෙන ගිය තැනැත්තකු අල්ලා ගත්තා ලදී. ඒ ගැන විමසන ලදුව ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "මා අදහස් නරනවා මෙම කුළුණ පුපුරුවා හැරීමට එය මාගෙන් ඉටුවිය යුතු ශ්‍රේෂ්ඨ කාර්යයක් බව" ❑

**මාතර**
**සුමිත් වීරතුංග**